**ගෝණගිරි රජමහා විහාරයේ පුස්කොළ පොත් එකතු පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක අධ්‍යයනයක්**
**(අනුරාධපුර දිස්ත්‍රික්කය ඇසුරෙන්)**

පූජ්‍ය ලැගුම්දෙණියේ පියරතන

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක අධ්‍යයනයක යෙදීමයි. සමස්ත දිවයිනම අවාරණය කිරීමට නොහැකි නිසා පුස්කොළ පොත් බහුල වශයෙන් පවතින ප්‍රධාන රජමහා විහාර වල පුස්කොළ එකතු අධ්‍යයනයට යොදා ගන්නා ලදී. ඒ අනුව ගෝණගිරි රජ මහා විහාරය නියැදිය වශයෙන් තෝරා ගැනිණි. එම විහාරස්ථානය තෝරා ගැනීමට ප්‍රධාන හේතුව වන්නේ එම විහාරස්ථානය අනුරාධපුර යුගයට අයත් රජ මහා විහාරස්ථානයක් වන අතර මෙම විහාරස්ථානයේ අනුරාධපුර යුගයේ සිටි සූරතිස්ස රජතුමා විසින් මෙම විහාරය ගොඩනගා තිබේ. එම විහාරය සතු පුස්කොළ පොත් එකතුව ග්‍රන්ථ විද්‍යාත්මක තත්වයන් පිළිබඳ සාධාරණීයකරනය කළ හැකි යැයි අපේක්ෂා කෙරිණි.
මෙම අධ්‍යයනයට ලක් කල පුස්කොළ පොත් එකතුව තුළ විවිධ විෂයන් ආවරණය වුනු කෘතීන් ලෙස ත්‍රිපිටක කෘතීන්, ජෝතිෂය සම්බන්ධ කෘතීන්, වෛද්‍ය විද්‍යා කෘතීන්, යන්ත්‍ර මන්ත්‍ර ශාස්ත්‍ර පිළිවෙල කෘතීන් දැකිය හැකි විය. වැඩි වශයෙන් ත්‍රිපිටක යන කෘතීන් දැකිය හැකි විය. මෙම පොත් එකතුවේ කෘතීන් 57 ක් දැකිය හැකි විය. එම ග්‍රන්ථ 57 ම අධ්‍යයනයට ලක් විය. මෙම අධ්‍යයනයට ලක් කරවූ කෘතීන් වල විෂය ක්ෂේත්‍රය හඳුනා ගැනීමට අතිරේකව ඒවායේ ග්‍රන්ථ විද්‍යාත්මක ලක්ෂණයන් කෙරෙහි සුවිශේෂ අවධානයක් යොමු කිරීමට මෙම අධ්‍යයනයේ දී හැකිවිය.

මෙම අධ්‍යයනයේ දී පුස්කොළ පොත් පිළිබඳ වාර්තා ගත කිරීමේදී භාවිත කළ යුතු ග්‍රන්ථ විද්‍යාත්මක විස්තර, වර්ගීකෘත, අකාරාදී ආදී අනුක්‍රම වලින් පෙළ ගැස්වීමේ අවශ්‍යතාවයක් පවතී. ඒ අනුව මේ සඳහා ලේඛන රැගත් ග්‍රන්ථ නාමාවලියක් සම්පාදනය සිදුකොට ඇත. පෙළ ගැස්වීමේ විධි ක්‍රමය යන කරුණු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර, එකී විහාරස්ථානය පිළිබඳ ග්‍රන්ථ නාමාවලියක් සම්පාදනය කරනු ලැබේ.

මුඛ්‍ය පද

1. පුස්කොළ පොත්
2. ලේඛන කලාව
3. ගෝණගිරි රජමහා විහාරය
4. ග්‍රන්ථ නාමාවලි
5. දේශීය ඥාණය